රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2005 (VII)

මගේ අංකය : EST-6/04/INS/1010
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.10.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## 2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධරයන් සඳහා වූ නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)

2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (VI) කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එහි 04 ඡේදය සහ 4:4 උපඡේදය පහත පරිදි සංශෝධනය කිරීමට 2017 අයවැය යෝජනා අනුව තීරණය කර ඇත.

> 04. විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා වයස අවුරුදු 70 සම්පූර්ණ වන තෙක් රු. 200/- ක මාසික දායකත්වය ද වයස අවුරුදු 70 න් ඔබ්බට රු.600/- ක මාසික දායකත්වය ද මත හඳුන්වා දෙන “අග්‍රහාර රකවරණ” රක්ෂණ යෝජනා ක්‍රමය පහත කොන්දේසි හා නියමයන්ට යටත්ව ඇමුණුම 04හි දැක්වෙන ප්‍රතිලාභ වෙනුවෙන් බලපැවැත්වේ.
>
> 4:4 ජීවිතාන්තය දක්වා ප්‍රතිලාභ හිමිකම් ලැබිය හැකිය.

03. ඉහත විධිවිධාන ඇතුළත් කරමින් 2016.05.31 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2016 අදාළ පරිදි ඉදිරියේ දී සංශෝධනය කරනු ඇත.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කෙරේ.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය